# ඔබේ මුදල් ගනුදෙනු ගැන ඔබ දැනුවත්ද?



## මහජනතාවගේ අවධානය සඳහා පළ කෙරෙන නිවේදනයකි

**1. මුදල් තැන්පත් කරද්දී, තැන්පත් කරන ආයතනය තැන්පතු රැස් කිරීමට අනුමැතිය ඇති ආයතනයක්දැයි සොයා බලන්න. තවද, තැන්පතුවට අදාල වන කොන්දේසි හොඳින් කියවා වටහා ගන්න.**
**එහිදී සලකා බැලිය යුතු මූලික කරුණු :**

- වාර්ෂික පොලිය සහ සඵල පොලිය
- පොලිය ගෙවනු ලබන හෝ ගිණුමට බැර කෙරෙන දිනයන්
- පොලිය නොගෙවන අවස්ථා
- ස්ථාවර තැන්පතුවක් නම්, තැන්පතුවේ කාල සීමාව සහ කල් පිරෙන දිනයට පෙර තැන්පතු ආපසු ගැනීමේදී අදාළ වන කොන්දේසි
- අමතර සේවා ගාස්තු

**2. ණය මුදලක් ලබා ගනිද්දී, ණය මුදලට අදාළ කොන්දේසි හොඳින් කියවා වටහා ගන්න.**
**එහිදී සලකා බැලිය යුතු මූලික කරුණු :**

- ගෙවිය යුතු වාර්ෂික හෝ මාසික පොලිය
- පොලී අනුපාතය ස්ථිර ද, වෙනස් වන සුළු ද යන්න
- පොලිය ගණනය කරන ආකාරය
- ණය මුදල ගෙවා නිම කිරීමට නියමිත කාලය
- වාරික ගණන
- එක් වාරිකයක ප්‍රමාණය
- වාරික ගෙවිය යුතු දිනයන්
- සුරැකුම් සහ ඇපකරුවන් පිළිබඳ අදාළ කරුණු සහ කොන්දේසි
- වාරික ගෙවීම ප්‍රමාද වූ විට අදාළ වන කොන්දේසි
- ණය මුදල කලින් ගෙවා නිම කරන්නේ නම්, එවිට අදාළ වන කොන්දේසි
- අමතර සේවා ගාස්තු

**3. අදාළ ආයතනය සමඟ කටයුතු කරද්දී පහත සඳහන් පරිදි ක්‍රියා කරන්න.**

- කිසියම් අපැහැදිලි කරුණක් වේ නම් එය ආයතනයෙන් විමසා පැහැදිලි කරගන්න.
- අයදුම්පත්, ලියකියවිලි ආදිය නිසි ලෙස කියවීමෙන් පසු සම්පූර්ණ කරන්න.
- හිස් ලියකියවිලිවල කිසිවිටෙක අත්සන් නොතබන්න.
- ගිණුම් පිළිබඳ ලේඛන, රහස්‍ය අංක ආදිය සුරක්ෂිතව තබා ගන්න.
- සත්‍ය තොරතුරු අදාළ ආයතනය වෙත හෙළි කරන්න.
- තම ලිපිනය වෙනස් වුවහොත්, ඒ පිළිබඳ විස්තර දැනුම් දෙන්න.
- වංචාකාරී හෝ සැකසහිත ගනුදෙනු පිළිබඳව දැන ගතහොත්, ඒවා වහාම අදාළ ආයතනයට දන්වන්න.
- අදාළ ආයතනය සම්බන්ධ පැමිණිලි ඇත්නම් ප්‍රථමයෙන් ඒවා එම ආයතනය සමඟ සාකච්ඡා කොට විසඳා ගන්නට වෑයම් කරන්න.

ඉහත සඳහන් අන්දමට විසඳුමක් නොලැබුණොත්, පහත දක්වා ඇති අංශයන් වෙත යොමු විය හැකි බව කරුණාවෙන් සළකන්න.

- ➢ කොළඹ 05, වජිර පාරේ, අංක 143 ඒ දරන ස්ථානයේ පිහිටි මූල්‍ය පැමිණිලි විභාග කරන නිලධාරි (මූල්‍ය ඔම්බුඩ්ස්මන්) කාර්යාලය (දුරකථන:011-2595624-5, විද්‍යුත් තැපෑල :forsril@sltnet.lk)
- ➢ ණය සම්බන්ධ කරුණක් පමණක් නම්, රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58, ශ්‍රී ලංකා මහ බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ පිහිටි ණය උපදේශන මධ්‍යස්ථානය (දුරකථන:011-2887006, විද්‍යුත් තැපෑල:upadeshana@gmail.com)

මෙහි ඇතුළත් කොට ඇත්තේ මූල්‍ය ගනුදෙනු සම්බන්ධ සමහර මූලික කරුණු පමණක් වන හෙයින්, ගනුදෙනු කිරීමේදී තව දුරටත් කරුණු විමසා බැලීම වැදගත් වනු ඇත.


**ශ්‍රී ලංකා මහ බැංකුව**
අංක 30, ජනාධිපති මාවත, කොළඹ - 1

දුරකථන: 011-2477100, 011-2477098, 011-2477128 ෆැක්ස්: 011-2477711
විද්‍යුත් තැපෑල: banksup@cbsl.lk වෙබ් අඩවිය: www.cbsl.gov.lk